**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය- 2021**

------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

-----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- අධිකාරියේ සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---------------------------------------------------------------------------

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

| | **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම**<br>------------------------------------- | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**<br>----------------------------- | **නිර්දේශය**<br>------------------------ |
|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා රාජ්‍ය** අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) 9 – තොග ; වසර අවසානයේ භෞතික තොග ශේෂ ගණන් කිරීම නිරීක්ෂණය කිරීමට නොහැකි වූ අතර ස්වාධීන තහවුරු කිරීම් නොමැති වීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු. 149,490,346 ක් වටිනා තොග අයිතම වල භෞතික පැවැත්ම තහවුරු කිරීමට විකල්ප ක්‍රම මගින් සෑහීමකට පත්වීමට නොහැකි විය. මෙම මුදලට අමතර කොටස් සහ මෙවලම්, අලෙවි නොකළ ප්‍රකාශන සහ අනෙකුත් ලිපි ද්‍රව්‍යවල වටිනාකම් ඇතුළත් ව තිබුණි.<br>මේ අතර, 2012 අගෝස්තු 06 වැනි දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී (COPE) අධිකාරියේ නිලධාරීන්ට උපදෙස් දී තිබුණේ අමතර කොටස් සහ මෙවලම් වැනි පුහුණු ද්‍රව්‍ය ප්‍රධාන තොගවලින් වෙන්කර වාර්ෂිකව එම භාණ්ඩ නැවත තක්සේරු කිරීමට කටයුතු කරන ලෙසයි. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 දින වන විටත් මෙම උපදෙස් පිළිපැදීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. තවද, කමිටුවක් පත්කර එයින් හඳුනාගන්නා ප්‍රයෝජනයට නොගන්නා ද්‍රව්‍ය බැහැර | තොග සත්‍යාපනයක් සඳහා සමීක්ෂණ මණ්ඩලයක් පත්කර සත්‍යාපනය සිදු කිරීමට අධිකාරිය සැලසුම් කර ඇති අතර තොගවලින් පුහුණු අයිතම හඳුනාගෙන වෙනම තක්සේරු කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත. තවද, තොග සත්‍යාපන ක්‍රියාවලිය අවසන් වූ පසු අධිකාරිය විසින් හානියට පත් සහ භාවිතයට ගත නොහැකි තොග අයිතම බැහැර කිරීමට කටයුතු කෙරේ. | අධිකාරිය විසින් සෑම වසරකම අවසානයේ භෞතික තොග ගණන් කිරීම සිදු කළ යුතු අතර පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) උපදෙස් පිළිපැදීමට කඩිනම් පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | කරන බවට කෝප් රැස්වීමේදී පොරොන්දු වුවද, 2022 මාර්තු.31 වන විටත් අධිකාරිය ඒ අනුව ක්‍රියා කර නොතිබුණි.<br>ඉහත කරුණු අනුව, 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දක්වා ඇති රු.මිලියන 149 ක තොග ශේෂයෙහි නිරවද්‍යතාවය සහ සාධාරණ වටිනාකම පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට නොහැක. | | |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS)- 7 දේපළ, පිරියත හා උපකරණ, ප්‍රමිතයේ 65 ඡේදය පරිදි පිරිවැය රු. 101,113,140 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබුණු අතර මෙම වත්කම් වල ඵලදායී ජීව කාලය හා සාධාරණ වටිනාකම නැවත තක්සේරු කර ගිනුම්ගත කිරීමකින් තොරව අඛණ්ඩව භාවිතාකරමින් තිබුණි.<br>තවද, SLPSAS 3 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ වැරදි ප්‍රමිතය අනුව ඉහත සම්පූර්ණ ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය වෙනස්වීම් ඇස්තමේන්තු වෙනස්වීම් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් මගින් කල් ඉකුත් වූ ස්ථාවර වත්කම් හඳුනා ගැනීම, වර්ගීකරණය කිරීම සහ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම යන කටයුතු සිදුකිරීමට සැළසුම් කරමින් පවතින අතර මීට සමාන්තරව සිදුකරනු ලබන වත්කම් තක්සේරු කිරීම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි. මෙම ක්‍රියාවලිය අවසන් වූ පසු අධිකාරියට සම්පූර්ණයෙන් ක්ෂය වූ රු. මිලියන 101 ක් වූ වත්කම්වල තක්සේරු වටිනාකම් ගිණුම්ගත කිරීමට හැකි වනු ඇත. | සම්පූර්ණ ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය තවදුරටත් ප්‍රමාදයකින් තොරව නැවත තක්සේරු කිරීමට ක්‍රියා කළ යුතු අතර නැවත තක්සේරුකිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ හෙළිදරව් කිරීම සහ ගිණුම්කරණ කටයුතු සිදුකළ යුතුය. |
| (ඇ) | විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව පාරිතෝෂිත දීමනා ගෙවීම සඳහා රු.154,045,468 ක මුදලක් ස්ථාවර තැන්පතු, ඇමතුම් තැන්පතු සහ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර තිබුණි. කෙසේ වුවත් මෙම ආයෝජන තුළ (රු. මිලියන 50ක ඇමතුම් තැන්පතු ඇතුළුව) වසර 4කට වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි. තවද, ආයෝජන සඳහා ලැබී තිබුණු පොලී ආදායම රු. මිලියන 7.5 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් 19 - "සේවක ප්‍රතිලාභ", ප්‍රමිතය ප්‍රකාර පාරිතෝෂිත ගෙවීම් ප්‍රතිපාදනවලට බැර නොකර සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ | පාරිතෝෂික ගෙවීම් සඳහා කලින් මුදල් ලබා ගැනීම තුළින් අධිකාරියට අපේක්ෂිත පොළී ආදායම අහිමි වන බැවින් පාරිතෝෂික සඳහා මුදල් ගෙවීම් අධිකාරියේ අරමුදල්වලින් ගෙවීම් සිදුකරන ලදී. තවද මෙම ආයෝජන සම්බන්ධ විස්තර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ප්‍රශස්ථ ආයෝජන සැළැස්මක් පිළියෙළ කර පොලී ආදායම් නැවත ප්‍රාග්ධනීකරණය කිරීමට | අධිකාරියේ සත්‍ය අසම්භාව්‍ය වගකීම් විශ්ලේෂණය කිරීම මත පදනමව ආයෝජන නැවත අගය කළ යුතුය. වසර 4 කට පෙර සිදුකරන ලද රු.මිලියන 50 ක කාලීන තැන්පතු සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියාකළ යුතුය. |

| | | |
|---|---|---|
| ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පාරිතෝෂිත ප්‍රතිපාදන එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණු අතර , සමාලෝචිත වර්ෂය සඳහා ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | කටයුතු කෙරේ. | |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට රු.745,463,465 ක් වටිනා ස්ථාවර වත්කම් නිසි පරිදි කේත කර නොතිබුණි. එමෙන්ම එම වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ඒ අනුව වාර්ෂික වත්කම් සත්‍යාපනය කිරීමට හැකි වන පරිදි එම කේත ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට හා අධිකාරිය විසින් ඉවත් කරන ලද භාණ්ඩ හා අලුතින් මිළදීගත් භාණ්ඩ දක්වමින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන්ට අනුකූලව තම ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | භාණ්ඩ සමීක්ෂණය අවසන් කිරීමෙන් පසු නිසි පරිදි කේතකරණය කළ, එක් එක් වත්කමේ පිරිවැය සහ අදාළ වත්කම් ස්ථාන ගතකර ඇති ස්ථාන සමග හඳුනා ගැනීම සඳහා යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛණය ලබා දීමට කටයුතු කෙරේ. | භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීමට පෙර අධිකාරිය මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර වත්කම් හි භෞතික පැවැත්ම නිවැරදිව හඳුනා ගැනීමට හැකි වන පරිදි දේපළ, පිරියත සහ උපකරණ (PPE) අයිතමයන් කේතකරණය කළ යුතුය. |
| (ආ) | පැලවත්ත, බත්තරමුල්ලෙහි පිහිටි ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) පිහිටි ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් වන අතර මේ සඳහා විධිමත් බදු ගිවිසුමකට එළඹීම සඳහා රු.54,890,701 ක මුදලක් හා මෙම මුදල මත පදනම්ව සියයට 7 ක ප්‍රමාද ගාස්තුවක් ලබාදෙන ලෙස 2019 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉල්ලා තිබුණි. මෙම ගැටළුව විසඳීමට අධිකාරිය විසින් විගණන වාර්තාව නිකුත් කරන දිනය වන විටත් අපොහොසත්ව තිබුණු අතර මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන හෝ හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | මෙම ගෙවීම් සිදුකිරීමට අධිකාරියට මුදල් නොමැති බැවින් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ගෙවීම් සඳහා සහනයක් ලබා දෙන ලෙස අධිකාරිය විසින් රේඛීය අමාත්‍යාංශය මගින් ඉල්ලීමක් කර ඇත.<br><br>මීට අදාළව නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා 2022.02.01 දින නාගරික සංවර්ධන අධිකාරියට ලිපියක් යවා මෙම සහනය ලබාදීමට සලකා බලන ලෙස ඉල්ලා ඇත. | මෙම ගැටළුව විසඳීමට අධිකාරියේ කඩිනම් අවධානය යොමු කළ යුතු අතර ඒ අනුව අවසන් ගිණුම්වල අදාළ හෙළිදරව් කිරීම් සහ ගැලපීම් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වසර 13ක සහතිකලත් අඛණ්ඩ අධ්‍යාපන (NVQ) පුහුණු වැඩසටහන පැවැත්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් 2020 සහ 2021 වසර තුළ පිළිවෙලින් රු.10,000,000ක් සහ රු.35,844,000ක් ලැබී තිබුණි. මෙම මුදල් වෙනම අරමුදල් ගිණුමකට බැර කිරීම වෙනුවට 2020 සහ 2021 වසර සඳහා ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. එයින් රු. 13,458,544 ක මුදලක් පමණක් 2021 දෙසැම්බර් 31 දින දක්වා මෙම පුහුණු වැඩසටහන සඳහා වියදම් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.32,299,656 කින් රඳවාගත් ලාභය වැඩියෙන් දක්වා තිබුණු අතර ඊට සමාන මුදලකින් 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් අඩුවෙන් දක්වා තිබුණි. තවද, මෙම පුහුණු වැඩසටහනේ ප්‍රගතිය විගණන කටයුතු සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නිසි මූල්‍ය, අධීක්ෂණය සහ හඳුනාගැනීම් සිදුකිරීමේ අඩුවක් ඇති බව අධිකාරියේ කළමනාකාරිත්වයට අවබෝධ වී ඇත. මීට අදාළව නිවැරදි කිරීම් සිදුවෙමින් පවතින අතර මෙම වසර අවසන් වන විට නිසි ගිණුම් ලේඛනගත කිරීම සඳහා ක්‍රියා පටිපාටිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. | මූල්‍ය ප්‍රකාශන සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා ගිණුම් පොත්වල නිවැරදි සහ සුදුසු ගිණුම් සටහන් ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ වත්කම් කාණ්ඩ 5කට අදාළව ස්ථාවර වත්කම් ලේඛනයේ සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සමුච්චිත ක්ෂයවීම් අතර රු.11,470,290 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් එක් එක් ශේෂයන් සැසඳුම් කර , මෙම වෙනස නිවැරදි කිරීම සඳහා ක්‍රියාකර නොතිබුණි. | නිවැරදි කරන ලද සමුච්චිත ක්ෂයවීම් ප්‍රමාණය 2021 මූල්‍ය ප්‍රකාශයේ පෙන්වා ඇත. විස්තර දැනටමත් විගණනය වෙත ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශන සහ ස්ථාවර වත්කම් ලේඛනය අතර සමුච්චිත ක්ෂයවීම් වෙනසක් නොමැත. | මෙම වෙනස්කම් නිවැරදි කිරීම සඳහා ශේෂ සැසඳුම් ප්‍රකාශනයක් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | ලැබී ඇති තොරතුරුවලට අනුව 2021 දෙසැම්බර් 31 දිනට වාහන 56ක් අධිකාරිය සතුව ඇත. එසේ වුවද, 2021දෙසැම්බර් 31 දින වන විට වාහන 46ක් සම්බන්ධයෙන් වන පිරිවැය, ක්ෂයවීම් සහ සමුච්චිත ක්ෂයවීම් පමණක් හඳුනාගෙන තිබුණි. තවද, මෙම වාහනවල භෞතික පැවැත්ම සහතික කිරීම සඳහා භෞතික සත්‍යාපනය වර්ෂය තුළ හෝ පෙර වර්ෂවලදී සිදු කර නොතිබුණි. එබැවින්, ඉතිරි වාහන 10 හි වටිනාකම සමාලෝචිත වර්ෂය තුළදී හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඇතැම් වාහන යන්ත්‍රෝපකරණ යටතේ වර්ගීකරණය කර ඇත (උදා: බවුසරය). මේ පිළිබඳ විග්‍රහ කළ යුතු අතර ඇතැම් බර වාහන ද යන්ත්‍ර සූත්‍ර ලෙස හඳුනාගෙන ඇත.<br>අධිකාරියේ පරිපාලනය විසින් ඊට අදාළ ආකෘතියේ සිදු කළ යුතු වෙනස්කම් හඳුනාගෙන ඇති අතර එය ඉදිරි වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ දී ක්‍රමවත් සිදුකරනු ලබයි. | අධිකාරියට අයත් සියලුම වාහන භෞතික සත්‍යාපනය කිරීමෙන් පසු හඳුනාගෙන ඒවා තක්සේරු කර ඒ අනුව ගිණුම්ගත කළ යුතුය. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| I | ඉඩම් | 77,000 | හිමිකම් ඔප්පු | මේ සම්බන්ධ විස්තර දැනට නොමැත. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් විස්තර ලබා ගැනීම සඳහා ඉඩම් හිමිකම් ඔප්පු ලබාදීමේ යෙදී සිටින නාගරික සංවර්ධන (UDA) වැනි ආයතනවලින් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරනු ලබයි. | මෙම ශේෂවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා කළමනාකරණය විසින් විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි සැපයිය යුතුය. |
| II | පුස්තකල පොත් | 2,294,871 | එක් එක් පොතේ මිල හා ප්‍රමාණයන් සඳහන් කරමින් සත්‍යාපන වාර්තා | අදාළ පුස්තකාල පොත්වල විස්තර ස්ථාවර වත්කම් ලේඛනයේ නොමැත. අධිකාරියේ සියලුම ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීමට කටයුතු කරනු ලබන අතර නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලියෙන් පසු ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙළ කළ හැක. | මෙම ශේෂවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා කළමනාකරණය විසින් විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි සැපයිය යුතුය. |
| III | ලැබිය යුතු තොග විකුණුම් ආදායම් | 16,485 | උපකාරක ලියකියවිලි | විස්තර ඉදිරියේ දී ලබාදීමට ක්‍රියා කෙරේ. | මෙම ශේෂවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා කළමනාකරණය විසින් විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි සැපයිය යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| IV | කුළී ආදායම | 4,547,050 | කුළී ආදායම් ලේඛණය, තක්සේරු වාර්ථා සහ කුළීකරුවන් පිළිබඳ විස්තර | විස්තරාත්මක උපලේඛණ මේ වන විටත් විගණනය වෙත ලබා දී ඇත. | මෙම ශේෂවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා කළමනාකරණය විසින් විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි සැපයිය යුතුය. |
| V | නිපුණතා සංවර්ධන වියදම් (PPP Model) | 79,956,244 | අදාළ ලිපි ගොණු, ක්‍රියාකාරී සැළැස්ම හා එහි ප්‍රගතිය. | විස්තර විගණනය වෙත ලබා දීමට කටයුතු කෙරේ. | මෙම ශේෂවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා කළමනාකරණය විසින් විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි සැපයිය යුතුය. |
| VI | ඉන්ධන, තෙල් හා වාහන ධාවන වියදම් | 9,815,791 | 2021 වර්ෂයේ සිදුකරන ලද ඉන්ධන දහනයන් පිළිබඳ පරීක්ෂන වාර්ථා | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කාර්යය මණ්ඩල කැඳවීම සීමා වීම නිසා ඉන්ධන දහනයන් පරීක්ෂා කිරීමට නොහැකි විය. | මෙම ශේෂවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා කළමනාකරණය විසින් විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි සැපයිය යුතුය. |
| VII | එකතු කළ අගය මත බදු ගෙවීම් (VAT) | 13,874,360 | වැට් බදු ප්‍රකාශණය (VAT Return), වැට් බදු ගණනය කිරීම සඳහා සලකා බැලූ බදු අය කළ හැකි සැපයුම් (ආදායම) හා වර්ෂයේ වැට් සඳහා ප්‍රකාශ කළ ආදායම අතර සැසදුම් ප්‍රකාශය. | වැට් බදු ගණනය කිරීමේ ප්‍රකාශණ දැනටමත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත මාර්ග ගත ක්‍රමයට හා හස්ත ක්‍රමයට ලබා දී ඇත.2022 ජනවාරි 01 දින සිට වැට් බදු ගෙවීම් හා වැට් බදු ප්‍රකාශන තොරතුරු සැසදීමට නිසි ක්‍රමවේදයක් සැකසීමට ක්‍රියා කෙරේ. | වැට් බදු ගෙවීම්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය තහවුරුකර ගැනීම සඳහා නිමවුම් මත බදු ගණනය කිරීම හා ඊට අදාළ බදු අයකළ හැකි ආදායම් සැසඳුම් ප්‍රකාශණයක් කළමණාකරණය විසින් සැපයිය යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු.10,753,391 ක් වූ ණය ගැතියන් 82 දෙනෙකුගෙන් ශේෂ තහවුරු කිරීම් ලිපි කැඳවූ අතර ඊට අදාළව තහවුරු කිරීම් ලැබී තිබුණේ රු.3,652,559 ක් වටිනා ණය ගැතියන් 14 දෙනෙකුගෙන් පමණි. තවද, විගණනයට සපයා ඇති වයස් විශ්ලේෂණයට අනුව රු.3,787,238 ක් වූ ණයගැති ශේෂයන් 2021 දෙසැම්බර් 31 දිනට වසර පහකට වැඩි කාලයක් හිඟව තිබූ අතර මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා මෙම මුදල අය කර ගෙන නොතිබුණි. 2020 සහ 2021 වර්ෂවල දී රු.1,488,531 ක ණයගැති ශේෂය නොවෙනස්ව පැවති අතර, ඒ අනුව, ණයගැති ශේෂයන් අයකර ගැනීම සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයක් පවතින බව විගණනයේ දී තවදුරටත් නිරීක්ෂණය විය. | 2021 දී ණය ගැතියන්ගේ නිෂ්කාශන ගිණුමේ දිගුකාලීන හිඟ මුදල් කපා හැරීමට ක්‍රියා කරනු ඇත. විවිධ ණය ගැතියන්ගෙන් දිගුකාලීන හිඟ මුදල් අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන ඇත. 2021 දී අදාළ ණය ගැතියන් වෙත යවන ලද ශේෂය තහවුරු කිරීමේ ලිපි යවා ඇත. ණය ශේෂයන් පිළිබද සිහිකැඳවීම් ලිපි අධිකාරියේ නීති අංශය මගින් සකස් කෙරෙමින් පවතී. | හිඟ ණයගැති ශේෂයන් අයකර ගැනීමට අධිකාරිය ඵලදායී පියවර ගත යුතු අතර ආපසු අයකරගත හැකි ණයගැති ශේෂයන් පමණක් අවසන් ගිණුම්වල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රැඳවුම් මුදල් රු.3,141,125 ක් සහ එයින් රු.2,274,459 ක් හෙවත් සියයට 72 ක් 2022 මැයි 31 දින වන විටත් පියවීමකින් තොරව වසර 05 කට අධික කාලයක් පැවතුණි.<br>එසේම, රු.4,660,622 ක් වූ විවිධ ණයහිමියන් 2021 දෙසැම්බර් 31 වන විට වසර 05 කට වැඩි කාලයක් හිඟව පැවති අතර එයින් රු.687,517 ක් වාර්තා කරන දිනට වසර 10 කට වැඩි කාලයක් තිස්සේ පියවා නොතිබුණි. මේ අතර, මෙම ශේෂයන් 2022 අප්‍රේල් 30 වන විටත් නොවෙනස්ව පැවතිණි. | විගණන හා කළමණාකරන කමිටු නිර්දේශ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ මත මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී ක්‍රියා කෙරේ. | ප්‍රමාදයකින් තොරව ගෙවිය හැකි සියලුම මුදල් ගෙවීමට ක්‍රියා කළ යුතු අතර අනෙකුත් ඒවා අවසාන ගිණුම්වලදී ආදායම ලෙස සැලකිය යුතුය. එසේම, වසර දෙකකට වැඩි කාලයක ඇති රැඳවුම් මුදල් අධිකාරියේ ආදායමක් ලෙස හඳුනා ගැනීමට ක්‍රියාකළ යුතුය. |

**1.6.3 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විවිධ අරමුණු සඳහා ලබා දී තිබුණු රු.1,347,357 ක් වන අත්තිකාරම් ශේෂ 16 ක් හා පෙරගෙවුම් ශේෂයන් වසර 5 කට අධික කාලයක් තිස්සේ අඛණ්ඩව පියවීමකින් තොරව ඉදිරියට ගෙන එමින් පැවතුණි. | විගණන හා කළමණාකරන කමිටු නිර්දේශ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ මත මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී ක්‍රියා කෙරේ. | අත්තිකාරම් ලබා දී ඇති කාර්යය අවසන් වූ වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | 2021 වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම විගණන වාර්තාව නිකුත් කරන දිනය වන විටත් මූල්‍ය ප්‍රකාශන සමඟින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව විගණනය වෙත ලබා දීමට කටයුතු කෙරේ. | කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ II කොටස, 7(1) වගන්තිය. | එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය විශාල ලෙස අවප්‍රමාණය වීම, ඉන්ධන හිඟය, ඉදිකිරීම් ද්‍රව්‍යවල විශාල මිල ඉහළ යාම, ඉදිකිරීම් කර්මාන්තය මුහුණ දෙන ද්‍රව්‍ය හිඟය වැනි වර්තමාන ගැටලු විසඳීමට අවශ්‍ය යෝජනා හා ක්‍රියාමාර්ග සම්බන්ධ තීරණ ගැනීම සඳහා සෑම මාස 03 කට වරක් ජාතික උපදේශක සභාව (NAC) පැවැත්වීම ඉතා වැදගත් වේ. කෙසේ වෙතත්, ඉදිකිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමට සහ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනයට සහ පැවැත්මට අවශ්‍ය ක්‍රියාමාර්ග යෝජනා කිරීමට සමාලෝචිත වර්ෂයේදී හා ඊට | ජාතික උපදේශක සභාව (NAC) හි 15 වන රැස්වීම 2022.01.04 දින රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් රේඛීය අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. ඉන් අනතුරුව, අධිකාරිය විසින් ලේකම්වරයාගේ උපදෙස් පරිදි මෙම රැස්වීමේ වාර්ථාව සකස් කර CIDA හි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2022.03.04 දිනැති ආවරණ ලිපිය සමඟ අමාත්‍යාංශය වෙත ඉදිරිපත්කර ඇත. ඉන් අනතුරුව, අධිකාරිය සමඟ සම්බන්ධීකරණයෙන් රැස්වීම් (NAC) සංවිධානය කිරීමට රේඛීය | ඉදිකිරීම් ක්ෂේත්‍රය මුහුණ දෙන වත්මන් ගැටළු වලට විසඳුම් ලබාදීම සඳහා ජාතික උපදේශණ සභා රැස්වීම් පවත්වා ඒ සම්බන්ධයෙන් නිසි ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට රජයට උපදෙස් දිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පෙර වසරේ ජාතික උපදේශන සභා රැස්වීම් පවත්වා නොතිබුණි. අධිකාරියේ වර්තමාන ඉදිකිරීම් දර්ශක මගින් රටේ සැබෑ මිල උච්චාවචනයන් පිළිබිඹු නොකරන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | අමාත්‍යාංශයේ තාක්ෂණික අංශයේ නිලධාරීන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් දිනයක් ලබාගෙන මීළඟ NAC රැස්වීම ළඟදීම පැවැත්වීමට නියමිත බව දන්වා ඇත. මේ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්වරයා සමඟ සාකච්ඡා කර මාස 3කට වරක් රැස්වීම කැඳවීමට සහාය ලබා ගැනීමට කටයුතු කර ඇත. | |
| (ඇ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 7(1) (අ), (ආ) සහ (ඇ) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා විගණනයට ඉදිරිපත් කරන ලෙස 2022 ජනවාරි 11 සහ 2022 මාර්තු 18 යන දිනයන්හිදී දෙවරක් කැඳවා තිබුණද විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ (2021) පැවති අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා නියමිත දිනට රජයේ විගණන කාර්යාලය වෙත භාර දීමට නොහැකි වූ අතර, අතපසුවීමක් හේතුවෙන් ඒවා පසු දිනක ඉදිරිපත් කරන ලදී. අනාගතයේදී නැවත ඇතිවීම වැළැක්වීම සඳහා පියවර ගනු ලැබේ. | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා කැඳවූ විට ඒවා විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| **(ඈ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මුදල් රෙගුලාසි 571 (2) | වසර 2ක කාලයක් තුළ ඇති සියලුම තැන්පතු අධිකාරියේ ආදායමට බැර කළ යුතු වුවද, එසේ නොකර, ගෙවිය යුතු රැඳවුම් මුදල් සහ ටෙන්ඩර් තැන්පතු වැනි හඳුනා නොගත් සහ කල් ඉකුත් වූ තැන්පතු රු.2,955,273 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අධිකාරිය විසින් තැන්පතු ලෙස රඳවා තිබුණි. | ටෙන්ඩර් තැන්පතු හිමියන්ට සිහිකැඳවීම් යැවීමට විගණන කළමනාකරණ කමිටුව උපදෙස් දී ඇත. ඒ අනුව, ටෙන්ඩර් තැන්පතු හිමියන් වෙත සිහි කැඳවීම් යවා ඇති අතර රඳවා තබා ගැනීමේ ගිණුමෙහි ගෙවිය යුතු ශේෂයන් පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වසර දෙකකට වඩා වැඩි සියළුම තැන්පතු අධිකාරියේ ආදායමට බැර කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 756,757,758, 759 සහ 2016 | • එක් මූල්‍ය වර්ෂයක් අවසානයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මුදල් රෙගුලාසිවලට අනුකූලව | මුදල් රෙගුලාසිවලට අනුකූලව |

| | | | | |
|---|---|---|---|---|
| | මාර්තු 31 දිනැති අංක 05/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | ජංගම නොවන වත්කම් සහ තොග අයිතමවල භෞතික පැවැත්ම සහතික කිරීම සඳහා වාර්තාකරණ කාලසීමාවට අදාළව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කළ යුතු වුවද, මෙම භාණ්ඩ සමීක්ෂණය සිදු කර, ඊට අදාළ සමීක්ෂණ වාර්ථා විගණනය වෙත වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සිදුකිරීමට කටයුතු කරනු ලබයි. | කටයුතු කළ යුතුයි. |
| | | • පසුගිය වර්ෂවල සමීක්ෂණ වාර්තාවල පෙන්වා දුන් අඩුපාඩු සහ අතිරික්තයන් මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වාවත් නිවැරදි කර නොතිබුණි. | | |
| | | • පෙර වසර සඳහා විගණනයට ඉදිරිපත් කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව, මුදල් රෙගුලාසි හි දක්වා ඇති ආකෘතිපත්‍ර) T. & A. 66 සහ පොදු 47) භාවිතා කරමින් එම භාණ්ඩ සමීක්ෂණය නිසි ලෙස පවත්වා නොමැති බව අනාවරණය විය. | 2021 වර්ෂය සඳහා සිදුකරනු ලබන භාණ්ඩ සමීක්ෂණය මුදල් රෙගුලාසිවලට අනුව සිදු කිරීමට කටයුතු කර ඇත. | මෙම මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුයි. |
| (ඉ) | 2020 ජනවාරි 27 දිනැති අංක PED/01/2020 දරණ මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 06 ඡේදය | එක් එක් සේවාව සඳහා ගත වන කාලයන් සහ ගාස්තු දක්වමින් පුරවැසි ප්‍රඥප්තියක් සකස්කර කාර්යාල පරිශ්‍රවල සහ වෙබ් අඩවිවල මහජනතාවට/පාරිභෝගිකයි න්ට ප්‍රදර්ශනය කළ යුතුය. කෙසේ වුවද, අධිකාරිය විසින් 2022 මැයි 31 දින වන විටත් මෙම චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පුරවැසි ප්‍රඥප්තිය මේ වන විට කෙටුම්පත් කරමින් පවතී. | අධිකාරියේ මහජන වගවීම සහ පාලනය වැඩිදියුණු කිරීම සඳහා පුරවැසි ප්‍රඥප්තිය සකස් කර ප්‍රදර්ශනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | යහපාලනය සඳහා වූ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දින PED/12 දරණ පොදු ව්‍යාපාර චක්‍රලේඛය. | | | |
| (i) | 4.2.5 ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩල මාසික රැස්වීම්වල සමාලෝචනය සහ සාකච්ඡා සඳහා තොග කාල විශ්ලේෂණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද ගිණුම්කරණ පදධතිය තුළින් තොග කාල විශ්ලේෂණ වාර්තාවක් ලබා ගැනීමේ හැකියාවක් අධිකාරියට නොමැත .එබැවින් තොග කාල විශ්ලේෂණය මත පදනම්ව සෙමින් චලනය වන ,චලනය නොවන සහ යල් පැන ගිය අයිතම හඳුනාගැනීමට නොහැකිව පැවතිණි. | මෘදුකාංග සංවර්ධකයා විසින් පද්ධතිය වැඩි දියුණු කල පසු තොග කාල විශ්ලේශණ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දෙනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට තොග කාල විශ්ලේශණ මත පදනම්ව සෙමින් චලනය වන හා චලනය නොවන තොග හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 6.5.3 ඡේදය | 2019 හා 2020 වර්ෂයේ වාර්ෂික වාර්ථා මෙම වාර්ථාවේ දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2019 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා 2022 පෙබරවාරි 08 වැනි දින රාජ්‍ය අමාත්‍යාංශය වෙත යවා ඇත. | නියමිත දිනට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |
| (iii) | 9.14 ඡේදය | අධිකාරියේ මානව සම්පත් සුමට හා ඵලදායී ලෙස පරිපාලනය සඳහා මානව සම්පත් කළමනාකරණයට අදාළ සියලු කරුණු | අධිකාරියේ මානව සම්පත් සහ පරිපාලන ක්‍රියා පටිපාටි අත්පොත 2019 ජනවාරි 30 දින පැවති අංක 01/2019 අධ්‍යක්ෂ | අධිකාරියේ මානව සම්පත් සුමට හා ඵලදායි ලෙස පරිපාලනය |

| | | | | |
|---|---|---|---|---|
| | | ඇතුලත් ක්‍රියා පටිපාටි අත්පොතක් තිබිය යුතු වුවද, එවැනි අනුමත අත්පොතක් අධිකාරිය සතුව නොතිබුණි. | මණ්ඩල රැස්වීම මගින් අනුමත කර ඇත. . | සඳහා නිසි පරිදි අනුමත ක්‍රියා පටිපාටි අත්පොතක් පැවතිය යුතුය. |
| (උ) | 2017 ජූනි 28 දින අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය සහ 2020 ජනවාරි 03 දින අංක 01/2017(1) | ඉඩම් සහ ගොඩනැගිලි, කුලියට ගත් බදු දේපල පිළිබඳ යාවත්කාලීන තොරතුරු 2021 මාර්තු 15 දිනට හෝ ඊට පෙර පාලක ජෙනරල්වරයා වෙත 2022 අප්‍රේල් 30 වන දින වන විටත් ඉදිරිපත්කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අධිකාරිය විසින් අදාළ චක්‍රලේඛයේ විධිවිධාන පරිදි අවශ්‍ය තොරතුරු සැපයිය යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වසරේ සිට 2021 දක්වා වූ කාලයට මහා භාණ්ඩාගාරයෙන් වරින් වර විවිධ කාර්යයන් සඳහා ලැබුණු මුදල් දළ වශයෙන් රු.මිලියන 202 සිට රු.මිලියන 410 දක්වා වූ මුදල් සෑම මසකම අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මගින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ කිසිදු කටයුත්තක් සඳහා ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව රඳවා තබා තිබුණි. එම ශේෂය 2022 පෙබරවාරි මාසය අවසන් වන විට රු.මිලියන 414.8 දක්වා අඛණ්ඩව ඉහළ ගොස් පැවතුණි. ඉහත මුදල් බැංකු ජංගම ගිණුමක නිෂ්කාර්යව තැබීමට ඉඩ හැරීමෙන් 2018 ජනවාරි සිට 2021 දෙසැම්බර් දක්වා කාලය තුළ රජයට දළ වශයෙන් රුපියල් මිලියන 98.3 ක මූල්‍ය පාඩුවක් සිදු වී තිබුණි. | අධිකාරියේ සාමාන්‍ය මාසික මුදල් අවශ්‍යතාවය රු.මිලියන 31 ක් හා (රු.මිලියන 7.7 ක ක්ෂය අඩුකළ පසු) කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය රු.මිලියන 29.3 කි. 2011 ජනවාරි 27 දිනැති අංක PED – 56 චක්‍රෙල්ඛය පරිදි අධිකාරියට මාස 6 ක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සඳහා ප්‍රමාණවත් මුදල් එනම් රු.මිලියන 175.8 ක් රඳවා තබා ගත හැකිය. 2022 වර්ෂය සඳහා අධිකාරියේ පුනරාවර්ථන වියදම් සඳහා මහාභාණ්ඩාගාරයෙන් අක්මුදල් (Imprest) අනුමත වී නොමැත. එමනිසා අධිකාරිය විසින් මෙම මුදල් 2022 අප්‍රේල් මස දක්වා වැටුප් ගෙවීම් සඳහා යොදා ගෙන ඇත. | අතිරික්ත මුදල් බැංකු ජංගම ගිණුමේ රඳවා නොගෙන මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.38,129,480 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.25,998,627 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,130,853 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අධිකාරියේ මෙහෙයුම් වියදම් පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී සැළකිය යුතු අගයක් එනම් රු.67,262,252 ක් අඩුවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 හඳුනාගත් පාඩු

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 ජනවාරි 01 සිට 2011 මැයි 31 දක්වා කාලයට අදාළව රු.14,977,525 ක හිඟ සේවක අර්ථසාධක අරමුදල් නොගෙවීම හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදල (EPF) විසින් රු.7,488,762 ක අධිභාර මුදලක් පනවා තිබුණි. කෙසේ වෙතත්, මෙම ගෙවිය යුතු රු. 22,466,287 ක මුදල 2022 අප්‍රේල් 30 වන විටත් සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි. | සේවක අර්ථසාධක අරමුදල මගින් විමර්ශනයක් සිදුකරන අතර ඔවුන් විසින් අදාළ ඉල්ලීම් ලිපියක් මෙතෙක් එවා නැත. ඊට අදාළ ඉල්ලීම් ලිපිය ලැබුණු පසු මෙම මුදල පියවීමට කටයුතු කෙරේ. | තවදුරටත් අධිභාර පැනවීම වළක්වා ගැනීම සඳහා හිඟ මුදල් වහා පියවිය යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදී සිටින ශිල්පීන් ශිල්පීය හැඳුනුම්පත් ලබාදීම සඳහා 2019 සහ 2020 වසර තුළ මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 35.7ක් ලැබී තිබුණි . එයින් රු .මිලියන 11.3 ක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2019 වසරේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) වෙත අත්තිකාරම් වශයෙන් ලබා දී තිබුණි. 2021 වර්ෂය තුළ ICTA | ICTA වෙත ලබා දී ඇති අත්තිකාරම් මුදල වන රු.මිලියන 11.3 න් ව්‍යාපෘතිය සඳහා වැය කළ රු. මිලියන 1.67 ක මුදල විස්තර කෙරෙන වාර්තාවක් ICTA විසින් අධිකාරිය වෙත එවා ඇත. මේ පිළිබඳ තොරතුරු | නිපුණතා ශිල්පීන්ට තවදුරටත් ප්‍රමාදයකින් තොරව ශිල්පීය හැඳුනුම්පත් නිකුත් කිරීමට අදාළ කටයුතු සිදු කළ යුතු අතර නොපියවූ අත්තිකාරම් මුදල ICTA වෙතින් අයකරගත යුතුය. |

| | |
|---|---|
| මගින් රු. මිලියන 9.6ක් එකඟ වූ කාර්යයන් ඉටු නොකර ආපසු ගෙවා තිබුණි. මෙම මුදල් 2022 අප්‍රේල් මස අවසන් වනතුරුත් අපේක්ෂිත කාර්යය සඳහා භාවිත නොකර බැංකු ජංගම ගිණුමේ අක්‍රියව පැවතුණි.<br>තවද,තොරතුරු තාක්ෂණ ආයතනය විසින් රඳවා ගෙන තිබූ අත්තිකාරම් රු.මිලියන 1.7 ක මුදල සම්බන්ධ තොරතුරු විගණනය සඳහා ලබා දී නොතිබුණි. | විගණනය සඳහා යොමු කිරීමට කටයුතු කෙරේ. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය පිහිටුවා වසර හතකට (07) වැඩි කාලයක් ගතවී ඇතත්, අධිකාරියේ මෙහෙයුම් කටයුතු සුමට හා ඵලදායීව සිදු කිරීම සඳහා 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ දක්වා ඇති පහත සඳහන් කටයුතු අධිකාරිය විසින් මෙතෙක් සිදු කර නොතිබුණි.<br>- ඉදිකිරීම් කර්මාන්තයේ භාවිතා වන ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ඉදිකිරීම් උපාංග ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන්ගේ නාමාවලියක් පවත්වාගෙන යාම;<br>- ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ ඔවුන්ට ශිල්පීය හැඳුනුම්පත් නිකුත් කිරීම;<br>- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම;<br>- වෙනත් රටවල ඉදිකිරීම් කටයුතු භාරගනු ලබන දේශීය වශයෙන් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම;<br>- ඉදිකිරීම් කර්මාන්තයේ අවශ්‍ය අමුද්‍රව්‍ය, පිරියත සහ යන්ත්‍රෝපකරණ අවශ්‍යතා සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම සහ ඉදිකිරීම් කටයුතුවලදී දේශීය නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ භාවිතය දිරිමත් කිරීම.<br>- ඉදිකිරීම් කර්මාන්තය සම්බන්ධ ජාතික දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම. | අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර ඇත. | රටේ දළ දේශීය නිෂ්පාදිතයට ඉදිකිරීම් කර්මාන්තයේ දායකත්වය වැඩි කිරීමට අධිකාරිය මෙම කටයුතු කඩිනම් කළ යුතුය. |

## 3.4 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජූනි 02 දිනැති යහපාලනය සඳහා වූ අංක PED/12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 වගන්තියේ විධිවිධානවලට පටහැනිව, පවතින තොරතුරුවලට අනුව අධිකාරිය විසින් 2002 සහ 2021 වර්ෂවලදී අධිකාරියේ සේවකයන් දෙදෙනකු රේඛීය අමාත්‍යාංශයට නිදහස් කර කර ඇත. තවද, මෙම නිලධාරියාට අධිකාරිය විසින් 2021 දෙසැම්බර් 31 දින දක්වා ගෙවා ඇති වැටුප් සහ අනෙකුත් දීමනා 2022 අප්‍රේල් 30 වන දින වන විටත් රේඛීය අමාත්‍යාංශයෙන් ගණනය කර ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියක් නොමැතිව අධිකාරිය විසින් කිසිදු සේවකයකු රේඛීය අමාත්‍යාංශය වෙත නිදහස් නොකළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | අධ්‍යක්ෂ (මුදල්) අධිකාරියේ සේවයේ යෙදී සිටියදී බරපතල විෂමාචාර සහ රාජ්‍ය මුදල් අවභාවිතය සම්බන්ධයෙන් 2021 ඔක්තෝබර් 08 දින සිට බලපැවැත්වෙන පරිදි සේවය අවසන් කර ඇත. කෙසේ වෙතත්, මෙම නිලධාරියා විසින් සිදු කරන ලද විෂමාචාර සහ මහජන මුදල් අවභාවිතය පිළිබඳව විගණකාධිපතිවරයා දැනුවත් කර නොතිබුණි. තවද, අධිකාරියේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා 2022 අප්‍රේල් 8 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිය තනතුරෙන් ඉල්ලා අස්වී ඇත. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා එම පුරප්පාඩු පිරවීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | හිටපු අධ්‍යක්ෂ (මුදල්) ගේ සේවය අවසන් කිරීමට එරෙහිව අධිකරණයේ නඩු විභාගයක් පවතින බැවින් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් මත එම ලේඛන ආයතනයෙන් පිටත හෙළිදරව් කිරීම සිදුකළ නොහැක. | නිලධරයා විසින් සිදු කරන ලද විෂමාචාර සහ රාජ්‍ය මුදල් අවභාවිතය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර පුරප්පාඩු වන මෙම තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති තරඟකාරී පුද්ගලයින් කිසිදු ප්‍රමාදයකින් තොරව බඳවා ගත යුතුය. |
| (ආ) | අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා 2021 ජනවාරි මාසය තුළ ඔහුගේ සේවය අවසන් කිරීම හේතුවෙන් ඔහු විසින් රු.1,956,538 ක ආසන්න වන්දි මුදලක් ඉල්ලා කම්කරු විනිශ්චය | මේ සම්බන්ධයෙන් අධිකාරියේ මානව සම්පත් සහ පරිපාලන අත්පොත අනුව කටයුතු කර ඇති බව අධිකාරියේ අධ්‍යක්ෂ | අධිකාරිය විසින් නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන මෙම අනිසි සහ නීති විරෝධී කළමනාකරණ තීරණය |

| | | |
|---|---|---|
| සභාවෙහි නඩුවක් ගොනු කර තිබුණි. මෙසේ ඔහුගේ සේවය අවසන් කිරීමට ගත් අයථා සහ නීති විරෝධී කළමනාකරණ තීරණයක් හේතුවෙන් අධිකාරියට මෙම අලාභය සිදුවී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර මෙම තනතුරද 2022 මාර්තු 31 දින දක්වා පුරප්පාඩු වී තිබුණි. | මණ්ඩලය පෙන්වා දී ඇත. එබැවින්, මේ සම්බන්ධයෙන් මානව සම්පත් සහ පරිපාලන අංශයෙන් මේ සම්බන්ධයෙන් මතයක් ලබා ගත හැක. | ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයාගෙන් අධිකාරියට සිදුවූ අලාභය අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කළ යුතුය. |

**3.6 වාහන පද්ධතිය කළමනාකරණය**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------------ | ------------------------------ | ------------------------- |
| රු.6,412,500 ක් වටිනා වාහන 5 ක් දිරායාමට ඉඩ හරිමින් අධිකාරියට අයත් ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු මධ්‍යස්ථානයෙහි වසර 3 කට අධික කාලයක් තිස්සේ 2022 මාර්තු 31 දින වන විටත් භාවිතයකින් තොරව පැවතුණි. මේ සම්බන්ධයෙන් නිකුත්කර ඇති 2020 ඔක්තොබර් 02 දිනැති අංක 05/2020 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි මෙම වත්කම් අළුත්වැඩියාවට හෝ අපහරනය කිරීමට කටයුතු සිදුකර නොතිබුණි. | අංක 56-5735 දරන වාහනය අලුත්වැඩියා කිරීමට කටයුතු කරමින් පවතී.<br>අංක 61-4630 දරන වාහනය අපහරනය කිරීමට සැළසුම් කර තිබුණද ගල්කුලම මෙහෙයුම් ශිල්පී පුහුණු පාසල (OTC) වෙත යැවීමට කටයුතු කර ඇත.<br>HA-1283, GB-9123 දරණ වාහන දෙක සම්බන්ධයෙන් වාහන අපහරනය කිරීමට අදාළ කමිටු වාර්තාව මෙතෙක් ලබා දී නොමැත. | මෙම අක්‍රිය වාහනවලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමට වහා පියවර ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------------

**4.1 සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැළැස්ම**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------------- | ---------------------------- | ------------------------ |
| රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.3 ඡේදය අනුව නියමිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පැහැදිලිව නිර්වචනය කරන ලද ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) ක්‍රියාත්මක බව සහතික කිරීම සඳහා සහ එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සමාලෝචනය කිරීමට සහ අවශ්‍ය ඕනෑම තැනක නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට 2021 - 2025 සහ 2022 - 2026 කාලය සඳහා උපාය | අදහස් දක්වා නොමැත | ලබා දී ඇති උපදෙස් අනුව උපාය මාර්ගික සැළැස්ම සහ ක්‍රියාකාරී සැළැස්ම සකස් කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

මාර්ගික සැලැස්මක් සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සඳහා ඇමුණුම 1 හි දක්වා ඇති ආකෘතියට අනුව සමාලෝචිත වර්ෂය සඳහා සහ ඉදිරි වසර සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර 2022 අප්‍රේල් 30 දිනට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා 2022 අප්‍රේල් 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි සිය ධූරයෙන් ඉල්ලා අස්වී ඇත. එම නිසා අධිකාරිය අභ්‍යන්තර විගණකවරයෙකු නොමැතිව ක්‍රියාත්මක වන අතර මේ වන විට අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව සිටින්නේ එක් කළමනාකරණ සහකාරවරයෙකු පමණි. | අදහස් දක්වා නොමැත. | එම පුරප්පාඩුව පිරවීමට වහා කටයුතු කල යුතුය. |